**කරෙයිනගර් ප්‍රාදේශීය සභාව**
**යාපනය දිස්ත්‍රික්කය**
**-----------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ 2016 මාර්තු 28 දින විගණනය සඳහා ඉදිරිපත් කරන ලද අතර ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2015 මැයි 19 දින ඉදිරිපත් කර තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපති වාර්තාව 2016 සැප්තැම්බර් 27 දින සභාවේ ලේකම් වෙත ඉදිරිපත් කරන ලදී.

## 1.2 තත්ත්වාගණණය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් කරෙයිනගර් ප්‍රාදේශීය සභාවේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගණකාධිකරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිමු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.3.1 ගිණුම්කරණ දෝෂ

එකතුව රු.326,416 ක් වූ උසාවි දඩමුදල් මූල්‍ය ප්‍රකාශනවල පෙන්වා නොතිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් සමාලෝචිත වර්ෂය සඳහා සභාව විසින් ජනිත ආදායම මූල්‍ය ප්‍රකාශනවල අඩුවෙන් දක්වා තිබුණි.

### 1.3.2 ලැබිය යුතු මුදල් හා ගෙවිය යුතු මුදල්

රු.16,765 ක් වූ අත්තිකාරම් මුදල් වර්ෂය තුලදී නිරවුල් කර නොතිබුණි.

### 1.3.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

විගණනය සඳහා අවශ්‍ය වූ තොරතුරු ඉදිරිපත් නොකිරීම හේතුවෙන් රු.587,104 ක් සඳහා වූ ගනුදෙනු හතරක් විගණනයේදී සන්නිරීක්ෂණය කළ නොහැකි විය.

### 1.3.4 නීති, රීති, රෙගුලාසි ආදියට අනුකූල නොවීම්

පහත දැක්වෙන නීති, රීති සහ රෙගුලාසිවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| **1988 ප්‍රාදේශීය සභා මූල්‍ය හා පරිපාලන රීති** | |
| (i) පරිච්ඡේදය II - රීති අංක 05 | මුදල් හා ගබඩා කටයුතු පිළිබඳ වගකිව යුතු නිලධාරීන්ගෙන් ඇප තැන්පතු ලබාගෙන නොතිබුණි. |
| (ii) පරිච්ඡේදය III - රීති අංක 32 | තක්සේරු බදු ලේඛණයක් සභාව විසින් පවත්වා නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, ඉකුත් වර්ෂය සඳහා වූ රු.4,913,151 ක් වූ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම සමඟ සැසඳුවිට, 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.4,865,497 ක් විය. වියදම රු.47,654 කින් වැඩිවීම, වියදම ඉක්මවූ ආදායම අඩුවීමට හේතුවිය.

### 2.2 කාරක ප්‍රාග්ධනය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව, ඉකුත් වර්ෂය සඳහා වූ රු.31,584,811 ක් වූ කාරක ප්‍රාග්ධනය සමඟ සැසඳුවිට වර්ෂය සඳහා වූ සභාවේ කාරක ප්‍රාග්ධනය රු.28,411,441 ක් විය. එහි ප්‍රතිඵලයක් වශයෙන් කාරක ප්‍රාග්ධන රු.3,173,370 කින් වැඩි වී තිබුණි.

### 2.3 ආදායම් කළමනාකරණය

#### 2.3.1 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

ලේකම් විසින් ඉදිරිපත් කරන ලද පරිදි, සමාලෝචිත වර්ෂය සඳහා වූ ඇස්තමේන්තුගත ආදායම, තත්‍ය ආදායම සහ හිඟ ආදායම පහත දැක්වේ.

| ආදායම් විෂයය | 2015 | | 2015 දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | ඇස්තමේන්තුගත | තත්‍ය | රු'000 |
| | රු'000 | රු'000 | |
| වරිපනම් හා බදු | 50 | 17 | - |
| බදු කුලී | 278 | 649 | - |
| බලපත්‍ර ගාස්තු | 227 | 219 | - |
| වෙනත් ආදායම් | 19,430 | 18,541 | 7,311 |
| | 19,985 | 19,426 | 7,311 |

**2.3.2 වරිපනම් හා බදු**

සභා ප්‍රදේශය තුල වූ දේපලවල වරිපනම් තක්සේරු කිරීම් වසර 25 ක් තිස්සේ සිදුකර නොතිබුණි.

**2.3.3 මුද්දර ගාස්තු**

2011 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා ඉඩම් රෙජිස්ට්‍රාර් ජනරාල් වෙතින් ලැබිය යුතු රු.11,722,957 ක් වූ මුද්දර ගාස්තු ලැබී නොතිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 මෙහෙයුම් ආකාර්යක්ෂමතා**

සභාවේ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ වැඩ රු.2,019,602 පිරිවැයකින් ආරම්භ කර නැතත් සමාලෝචිත වර්ෂය තුලදී නිමකර නොතිබුණි.

**3.3 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

සභා ප්‍රදේශය තුල ඝන අපද්‍රව්‍ය කළමනාකරණය විධිමත්ව ක්‍රියාත්මක කර නොතිබුණි.

**4. වගකීම්භාරය සහ යහපාලනය**

**4.1 අයවැය පාලනය**

අවිධිමත් අයවැය පිළියෙල කිරීම නිසා අයවැයගත වියදම හා තත්‍ය වියදම අතර රු.770 සිට රු.2,869,041 දක්වා වූ වෙනස්කම් නිරීක්ෂණය විය.

**4.2 අභ්‍යන්තර විගණනය**

අභ්‍යන්තර විගණන කටයුතු එලදායි අන්දමින් ක්‍රියාත්මක කර නොතිබුණි.

**4.3 විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්**

විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි.

**4.4 වත්කම් කළමනාකරණය**

(අ) සභා වාහන පහක් නිෂ්කාර්යව පැවතුණි.

(ආ) සභාවට අයත් වාහන 15 ක අයිතිය පැවරීමට කටයුතු කර නොතිබුණි.

**5. පද්ධති හා පාලන**

පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ආදායම් රැස්කිරිම

(ආ) වාහන උපයෝජනය

(ඇ) අයවැය